# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දිවි නැගුම (සංශෝධන)

**2013 අංක 1 දරන දිවි නැගුම සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

සමාජ සවිබලගැන්වීමේ හා සුභසාධන අමාත්‍යතුමා විසින්
2016 දෙසැම්බර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 දෙසැම්බර් මස 21 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[153 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2, 3 සහ 4 වන වගන්ති*** **:** මෙම වගන්ති මගින් 2013 අංක 1 දරන දිවි නැගුම පනත සහ අනිකුත් ලිඛිත නීති සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) එම පනතේ සහ අනිකුත් ලිඛිත නීතිවල ''දිවි නැගුම'' යන වචනය යෙදෙන සෑම තැනක ම ඒ වෙනුවට ''සමෘද්ධි'' යන වචනය ආදේශ කිරීම; සහ

(ආ) එම පනත යටතේ පිහිටුවන ලද නීතිමය අස්ථිත්වයන් හි නම්වල යොද ඇති ''දිවි නැගුම'' යන වචනය වෙනුවට ''සමෘද්ධි'' යන වචනය ආදේශ කිරීමෙන් එම නම් වෙනස් කිරීම වේ.

එල්. ඩී.—ඕ. 58/2015

**2013 අංක 1 දරන දිවි නැගුම පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක  දරන දිවි නැගුම (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2013 අංක 1 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ දීර්ඝ නාමය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ''දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව'' යන යෙදුම වෙනුවට ''සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව'' යන යෙදුම ආදේශ කිරීමෙන්; සහ

(ආ) "දිවි නැගුම" යන වචනය වෙනුවට "සමෘද්ධි" යන වචනය ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාවේ දෙවන ඡේදයේ "දිවි නැගුම අදහස් කරන හෙයින් ද:" යන වචන වෙනුවට "සමෘද්ධි අදහස් කරන හෙයින් ද:" යන වචන ආදේශ කිරීමෙන් එම පූර්විකාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට සහ වෙනත් ලිඛිත නීතිවලට කරනු ලබන පොදු සංශෝධන.

**4.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක—

(අ) "දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(ආ) "දිවි නැගුම ජාතික සභාව" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි ජාතික සභාව" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(ඇ) "දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

2—PL 010297—475 (2016/11)

(ඈ) "දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(ඉ) "දිවි නැගුම දිස්ත්‍රික් කමිටු" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි දිස්ත්‍රික් කමිටු" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(ඊ) "දිවි නැගුම ජාතික සම්මේලනය" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි ජාතික සම්මේලනය" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(උ) "දිවි නැගුම ප්‍රජා මූල බැංකු" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි ප්‍රජා මූල බැංකු" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(ඌ) "දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිති" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(එ) "දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි ප්‍රජා මූල බැංකු සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(ඒ) "දිවි නැගුම ප්‍රජා මූල බැංකු මහා සංගමය" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමය" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(ඔ) "දිවි නැගුම සංවර්ධන අරමුදල" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි සංවර්ධන අරමුදල" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(ඕ) "දිවි නැගුම චක්‍රීය අරමුදල" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි චක්‍රීය අරමුදල" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය;

(ක) "දිවි නැගුම ප්‍රතිලාභියා" යන යෙදුම යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "සමෘද්ධි ප්‍රතිලාභියා" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය; සහ

(ග) "දිවි නැගුම" යන වචනය වෙනුවට "සමෘද්ධි" යන වචනය ආදේශ කරනු ලැබිය යුතු ය.

(3) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක, "දිවි නැගුම පනත", "දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව", "දිවි නැගුම ජාතික සභාව", "දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන", "දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන", "දිවි නැගුම දිස්ත්‍රික් කමිටු", "දිවි නැගුම ජාතික සම්මේලනය", "දිවි නැගුම ප්‍රජාමූල බැංකු", "දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිති", "දිවි නැගුම ප්‍රජාමූල බැංකු සහ දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය", "දිවි නැගුම ප්‍රජාමූල බැංකු මහා සංගමය", "දිවි නැගුම සංවර්ධන අරමුදල", "දිවි නැගුම චක්‍රීය අරමුදල", "දිවි නැගුම ප්‍රතිලාභියා" සහ "දිවි නැගුම" යනුවෙන් සඳහන් කර ඇති සෑම අවස්ථාවක දී ම, පිළිවෙළින් "සමෘද්ධි පනත", "සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව", "සමෘද්ධි ජාතික සභාව", "සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන", "සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන", "සමෘද්ධි දිස්ත්‍රික් කමිටු", "සමෘද්ධි ජාතික සම්මේලනය", "සමෘද්ධි ප්‍රජාමූල බැංකු", "සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති", "සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය", "සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය", "සමෘද්ධි සංවර්ධන අරමුදල", "සමෘද්ධි චක්‍රීය අරමුදල", "සමෘද්ධි ප්‍රතිලාභියා" සහ "සමෘද්ධි" යනුවෙන් කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.